සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி,வதிவிடப் பொருளாதார,நுண்நிதிய,சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

| මගේ අංකය<br>எனது<br>My No | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය<br>திகதி<br>Date |
|---|---|---|
| DSD/HO/07/SD/08/01-AP | ........................................ | 2021.03.02 |

## සමෘද්ධි චක්‍රලේඛ අංක : 2021/04

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන් වෙත.

**<u>සමෘද්ධි සමාජ සංවර්ධන වැඩසටහන - 2021</u>**

2030 වසර වන විට දුගී බවෙන් තොර, සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම වන අතර අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කළ **සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ** සඳහන් සමාජ සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අදාල පහත සඳහන් අභිප්‍රායන් අනුව 2021 වර්ෂයේ සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පෙළ ගස්වා ඇත.

| සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නියමිත කොටස හා ප්‍රධාන මාතෘකාව | සමාජ සංවර්ධන විෂය පථයට ඉලක්ක කර ගත හැකි අනු මාතෘකාව | අදාල වැඩ සටහන |
|---|---|---|
| • තෙවන කොටස<br>සුරක්ෂිත රටක් | මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් | මත් නිවාරණ, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන |
| • සිව් වන කොටස<br>ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත් වන පවුලක් | නිරෝගීකමට මුල් තැන | i. බෝ නොවන රෝග අවම කිරීම සඳහා කාබනික ආහාර ප්‍රවර්ධන වැඩ සටහන<br>ii. කායික හා මානසික රෝග අවම කිරීමේ වැඩ සටහන් (උපදේශණය) |
| | නැණබල සහිත ළමා පරපුරක් | සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩ සටහන (පුස්තකාල ප්‍රවර්ධනය වැඩසටහන්) |

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |
| | | **Hot Line :0112-889007** | | | |

| | | |
|---|---|---|
| | සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක් | මත් නිවාරණ, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන |
| | සෑම පවුලකටම සුව පහසු නිවසක් | i.සමෘද්ධි හා අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා වන දිරිය නිවාස වැඩසටහන<br>ii.සනීපාරක්ෂක පහසුකම් (වැසිකිල වැඩ සටහන) |
| • අට වන කොටස තිරසාර පරිසර ප්‍රතිපත්තියක් | කසලකළමනාකරණය | පරිසර සුරක්ෂිතාවය ආරක්ෂා කිරීමේ වැඩසටහන<br>i.පිවිතුරු වෙරළක් /පිවිතුරු ගංගා ගොඩනැගීමේ වැඩසටහන<br>ii. කසල ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන |
| • නව වන කොටස ගුණගරුක විනයගරුක නීති ගරුක සමාජයක් | සංස්කෘතිය සාහිත්‍ය සහ කලාව | ළමා සමාජ වැඩ සටහන (සංස්කෘතික හා සාහිත්‍ය) |

02. පසුගිය වසරවල මෙන් සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන් මුහුණ දෙන සමාජීය, කායික හා මානසික ගැටළු නිවැරදිව හඳුනා ගෙන එම ගැටළු අවම කර ගැනීම සඳහා එකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීමටත්, නූතන සමාජ සංකීර්ණතාවය හමුවේ වියැකී යන සංස්කෘතික හා සාහිත්‍යමය හරයන් සුරැකීමේ අරමුණින් ළමුන්ගේ දායකත්වයෙන් සාහිත්‍යමය හා අධ්‍යාපනික ප්‍රවර්ධනය ඉලක්ක කර සමාජ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමටත් වැඩසටහන් සැලසුම් කරගත යුතු වේ.

03. ඒ අනුව 2021 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සමාජ සංවර්ධන වැඩසටහන් පහත දක්වා ඇත. එක් එක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ඇමුණුම් අංක 1 සිට 7 ලෙස දක්වා ඇති අතර එක් එක් වැඩසටහන සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෙන් වන ප්‍රතිපාදන පිළිබඳ විස්තර ඇමුණුම් අංක 08 හි දක්වා ඇත. ඒ අනුව ඉහත ඉලක්කයන් සාධනය කර ගත හැකි ආකාරයෙන් ඔබ දිස්ත්‍රික්කයේ සමාජ සංවර්ධන වැඩසටහන් සැලසුම් කරගත යුතුය.

| | | |
|---|---|---|
| 1 | "දිරිය පියස" නිවාස වැඩසටහන | ඇමුණුම 01 |
| 2 | මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණය, ගෘහ කළමනාකරණය හා සතුටු පවුල් වැඩසටහන | ඇමුණුම 02 |
| 3 | බෝ නොවන රෝග අවම කිරීම සඳහා කාබනික ආහාර ප්‍රවර්ධන වැඩසටහන<br>• දේශීය ආහාර පරිභෝජනය යොමු කිරීමේ වැඩ සටහන | ඇමුණුම 03 |

| | | |
|---|---|---|
| 4 | සමෘද්ධි ප්‍රතිලාභී පවුල්වල කායික හා මානසික ගැටළු අවම කිරීමේ වැඩසටහන<br>• සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ මානසික සෞඛ්‍ය වැඩ දියුණු කිරීමේ වැඩසටන (උපදේශන වැඩ සටහන) | ඇමුණුම 04 |
| 5 | සමෘද්ධි කැකුළු ළමා සමාජ වැඩසටහන<br>• සංස්කෘතික හා සාහිත්‍ය වැඩ සටහන<br>• පුස්තකාල ප්‍රවර්ධන වැඩ සටහන | ඇමුණුම 05 |
| 6 | සනීපාරක්ෂක වැසිකිළි පහසුකම් සැපයීමේ වැඩ සටහන | ඇමුණුම 06 |
| 7 | සමෘද්ධි සහනාධාරලාභීන් හා අඩු ආදායම්ලාභී සමෘද්ධි බැංකු සාමාජිකයින් සඳහා ගෘහස්ථ විදුලිය ලබාදීමේ වැඩ සටහන (සැමට විදුලිය ලබාදීම) | ඇමුණුම 07 |
| 8 | පරිසර සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීමේ වැඩසටහන<br>• පිවිතුරු වෙරළක් /පිවිතුරු ගඟක් ගොඩනැංවීමේ ඒකාබද්ධ වැඩසටහන<br>• අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ වැඩ සටහන<br>( වෙනත් ආයතන හා ඒකාබද්ධව ක්‍රියාත්මක වේ) | උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ |

04. 2021 වසරේ යෝජිත අංක 2,3,4 වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට පෙර ඇමුණුම 9 ආකෘතිය අනුව ඒ එක් එක් වැඩසටහනට සම්බන්ධ කර ගත යුතු සුදුසුම පුද්ගලයා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර ඒ මත පදනම්ව පුහුණු වැඩසටහන් වලට සම්බන්ධ කළ යුතුය.

05. ඉහත වැඩසටහන් නිසි පරිදි ක්‍රියාත්මක වේද යන්න මැන බැලීමටත්, ගැටළු සමාලෝචනය තුළින් නව යෝජනා ඉදිරිපත් කිරීමටත්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචනය සිදු කිරීමටත් අපේක්ෂා කෙරේ. ඒ අනුව දිස්ත්‍රික් මට්ටමින් මාසිකව පැවැත්වෙන මූලස්ථාන සමෘද්ධි කළමනාකරුවන්ගේ ප්‍රගති සමාලෝචන වැඩමුළුවේ දී ප්‍රගතිය සාකච්ඡා කිරීම කළ යුතුය. සමාජ සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය පුළුල් ලෙස කාර්තුමය වශයෙන් සාකච්ඡා කිරීම සඳහා පමණක් කාර්තුවකට එක් වැඩසටහන බැගින් වන සේ වැඩසටහන් 04 ක් සඳහා ප්‍රතිපාදන ලබාදීමට අපේක්ෂිතය.

**ප්‍රාදේශීය මට්ටම** - සියලුම වසම් ආවරණය වන පරිදි සෑම මසකම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රගති වැඩමුළු පැවැත්වීම හා ප්‍රගතිය දිස්ත්‍රික් මට්ටමට ලබාදීම.

**දිස්ත්‍රික් මට්ටම** - දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කළමනාකාර අධ්‍යක්ෂවරුන්/මූලස්ථාන කළමනාකරුවන් හා සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ සහභාගිත්වයෙන් කාර්තුමය එක් වැඩසටහනක් පැවැත්විය යුතුය .

**ජාතික මට්ටම** - දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරුවන්ගේ හා සමාජ සංවර්ධන නිලධාරින් ද ඇතුලුව වර්ෂයකට දෙවරක් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කෙරේ.

06. දිළිඳු බව අවම කර සමාජ සාධාරණත්වය සහතික කරනු ලබන සමාජයක් බිහි කිරීමට පුද්ගලයා සංවර්ධනය කිරීම මූලික පියවර වේ. පුද්ගලයා, පවුල, කණ්ඩායම සහ ප්‍රජාව ගේ ආකල්ප, දැනුම හා කුසලතා සංවර්ධනය කර මූලික මානව අවශ්‍යතා සපුරාලන නිවාස, විදුලිය හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සඳහා පහසුකම් සැලසීමත් ඒ

මඟින් ඔවුන්ගේ මානව පෞරුෂය සාමාජීක ක්‍රියාකාරකම් දැහැමි හා අධ්‍යාත්මික ගුණාංග වැඩි දියුණු කිරිම සඳහා හිතකර මනෝ සමාජීයීය සංවර්ධන පරිසරයක් ඇති කළ යුතු වේ.

එමෙන්ම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරිමේ හැකියාව දියුණු කිරිම සඳහා දුම්වැටි, මධ්‍යසාර, සමාජ අපචාර වැනි සමාජ ප්‍රගමනයට බාධා කරවන සමාජ ප්‍රතිරෝධක සඳහා යොමු වන විනාශකාරි මුදල් නාස්තිය අවම කළ යුතු වේ. ඒ මඟින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරිම වේගවත් කිරිමෙන් ආර්ථික සංවර්ධනය ළඟා කර ගත් ප්‍රජාවගේ සුභ සිද්ධිය සඳහා හිත කර වන යුක්ති ගරුක සාමාජයීය පරිසරයක් ඇති කිරිම සමාජ සංවර්ධන වැඩ සටහනේ කාර්ය භාරය වේ. මෙසේ භෞතික ව ඉතිරි කිරිම්වලට යොමු වන පුද්ගලයා සදාචාරාත්මකව ද සංවර්ධනය කරා ලඟා වනු ඇත.

07. ඉහත සමස්ථ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දි අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතු බව වැඩිදුරටත් දන්වමි. දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය සැම මසකම 05 දිනට පෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ලබාගෙන ඇමුණුම් අංක 10 , 11 A, B හා 12 අනුව සමෘද්ධි සමාජ සංවර්ධන අංශය වෙත සැම මසකම 10 දිනට පෙර එවිය යුතුය.

08. කඩිනමින් තොරතුරු යොමු කිරිම සඳහා socialdev@divineguma.gov.lk විද්‍යුත් ලිපිනය හෝ 0112-889005 දරණ ෆැක්ස් අංකය ද භාවිත කළ හැකිය. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩි විස්තර 0112-889005, 0112-876601 දුරකතන අංක වලට සමාජ සංවර්ධන අංශය ඇමතිමෙන් ලබාගත හැකිය.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

01. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා , ව්‍යාපර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස
02. අතිරේක ලේකම්(සමෘද්ධි සංවර්ධන), - එම - - කා.දැ.ගැ.ස
03. විගණන අධිකාරී, රජයේ විගණන අංශය - කා.දැ.ගැ.ස.
04. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
06. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.